බාලවයස්කාර ලිංගික අපයෝජනය යනු කිසිසේත්ම සුළුවෙන් තැකිය හැකි සමාජ ගැටළුවක් නොවේ. එය නීතිය ඉදිරියේ දඬුවම් ලැබෙනා වරදකි. එහිදී බාලවයස්කරුගේ කැමැත්ත තිබේද නැද්ද යන්න පවා අදාළ නොවන්නේ, බාලවයස්කරුවෙකු යනු ලිංගික සබඳතාවයක් වැනි කරුණක් පිළිබඳව තීරණ ගත හැකි වයසක සිටින්නෙකු නොවන බැවිනි. එනිසා, එවැනි අවස්ථාවකදී වුවත් එය ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක් ලෙසින් සැලකෙන අතර, ඊට නීතියෙන් දඬුවම් හිමිවේ.
ලංකාදීප පුවත්පතේ (07/02) මෙවැනි බාලවයස්කාර ලිංගික අපයෝජනයක් පිළිබඳව සඳහන් වන්නේ, "ඔන්ලයින් ඉගෙනුමට අරන් දුන් දුරකතනයෙන් දුව දීගයක් කරගෙන" යනුවෙනි.
එසේම මව්බිම පුවත්පතේ (07/02) විදෙස් පුවත් තීරයේද බාලවයස්කාර ලිංගික අපයෝජනයක් සම්බන්ධව සඳහන් කෙරෙන්නේ, "කුඩා ගැටවරයන්ගෙන් හිරි ඇරගත් කතක් වසර 102 ක් හිරගෙට" යනුවෙනි. මෙම දෙවෙනි විදෙස් පුවත, විදෙස් පුවත් සේවාවන් තුළ ඉදිරිපත් වී ඇත්තේ, Mother in Nebraska jailed for sexually assaulting children during sleepovers at her home (Independent), Nebraska mom sentenced for sexually assaulting children during sleepovers (Fox News) වැනි සිරස්තල සමගිනි. මව්බිම සිරස්තලයේ මෙන් නොව, මෙම ජාත්‍යන්තර පුවත් සිරස්තල තුළ, මෙය බාලවයස්කාර ලිංගික අපයෝජනයක් බව පැහැදිලිව දක්වා තිබේ.
මෙහි ලංකාදීප පුවත් සිරස්තලයෙන් අපයෝජනයට ලක්වූ වින්දිත බාලවයස්කාර දැරියට දෝෂාරෝපණය කිරීමක් දක්නට ලැබේ. එසේම ලංකාදීප මෙන්ම මව්බිම පුවත්පත් දෙකේම මෙම සිරස්තලයන් ඔස්සේ බාලවයස්කාර ලිංගික අපයෝජනයක් "දීගයකට" සහ "හිරි ඇරගැනීමකට" ලඝු කර තිබේ. මෙම සිරස්තලයන්ගෙන් සමාජයට බාලවයස්කාර ලිංගික අපයෝජනයක ඇති බරපතළ බව ඉදිරිපත් වන්නේ යැයි ඔබ සිතන්නේද? මෙවැනි සිරස්තල ඔස්සේ සමාජයට ලැබෙන්නේ වැරදි පූර්වාදර්ශයන් නොවේද? මේ පිළිබඳ ඔබේ අදහස් මොනවාද?
#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Mawbima